


**ශ්‍රී. බු. ව. 2556 වෙසක් මස කලාපය, රා. ව. 2012 ක් වූ මැයි මස 05 වන දින**

**මාතර,ශ්‍රී සුදර්ශි මහ පිරිවෙන්හි පරිවෙනාධිපති දෙව්නුවර, කපුගම ශ්‍රී සුධර්මාරාමාධිපති**

**ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්වහන්සේ විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

# කියන දේ කරන කරන දේ කියන පිරිසක් වී සසර කෙටිකර ගනිමු.

(අඞගුතතර නිකයේ පඤචක නිපාතයේ කකුධ සූත්‍රය ඇසුරෙනි.)

ගෞරවණීය ස්වාමීන් වහන්ස,
කාරුණික පින්වත්නි,

අද වෙසක් පුර පසළොස්වක පොහොය දිනය යි. ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රේෂ්ඨ ජීවිතයෙහි ඉපදීම, බුදුවීම, පිරිනිවන් පෑම යන අවස්ථා තුනම සිදුවූයේ මෙවන් වෙසක් පුර පසළොස්වක පොහොය දිනයක ය. මෙම උතුම් පොහොය දිනයෙහි බෞද්ධයින් වන අපි හැමෝම තථාගතයන් වහන්සේට ආමිසයෙන් හා ප්‍රතිපත්තියෙන් පූජා කරමු. ලක්දිව විහාරස්ථානවල දහස් ගණනින් සීල සමාදාන පවත්වමින් සිදුකරන්නේ ප්‍රතිපත්ති පූජාවයි. ප්‍රතිපත්ති පූජාව යනු බුදුන්වහන්සේ දේශනා කළ සදහම් මගෙහි අවංකව අව්‍යාජව ගමන් කිරීම යි.

මෙම උතුම් පොහොය දිනයෙහි මෙම සදහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ තථාගතයන් වහන්සේ තුළ පැවැති යථාවාදී තථාකාරී ගුණය හඳුන්වාදී ඒ මග ගමන් කිරීමේ ප්‍රතිපදාව හඳුන්වා දීමට ය. තථාගත යන වචනයේ සරළ අර්ථය තථ්‍යට හෙවත් සත්‍යයට පැමිණි යන්න ය. තථාගතයන් වහන්සේ යනු සත්‍යයේ ප්‍රතිමූර්තිය යි. සත්‍යාවාදී බවේ අග්‍ර ඵලය යි. නව අරහාදී බුදු ගුණය ගැන සඳහන් වන තැන "විජජාචරණ සමපනන" යනුවෙන් ගුණපදයක් සඳහන්වේ. එහි විජජා යනු දැනුමයි. චරණ යනු හැසිරීම යි. දැනීමට අනුව හැසිරීම මෙයින් අදහස් කෙරේ. මනා පෞරුෂයක් ඇති ශාස්තෲවරයෙකු වීමට නම් තම දැනුමින් ප්‍රකාශ කරන දේ තම ජීවිතය තුළ ක්‍රියාත්මක කළ යුතු යි. ජීවිතය ක්‍රියාත්මක කරන දේම ප්‍රකාශ කළ යුතු යි. මෙම යථාවාදී තථාකාරී ගුණය ගැන විස්තර කර දීම සඳහා අප මෙහිදී යොදාගනු ලබන්නේ අඞගුතතර නිකායේ පඤචක නිපාතයේ කකුධ වර්ගයේ සඳහන් කකුධ සූත්‍රය යි.

බුදුපියාණන් වහන්සේ කොසඹෑනුවර ඝෝෂිතාරාමයෙහි වැඩ සිටිනා කාලයෙහි මුගලන් මහ රහතන් වහන්සේගේ උපස්ථායකයෙකු වූ කකුධ නම් කෝලිය පුත්‍රයෙකු පරලොව ගොස්

මනෝ කායික දිව්‍ය පුත්‍රයෙකු වී උපන් හ. සූත්‍රය සඳහන් කරන පරිදි එම දේවතාවාගේ සිරුර මගධයෙහි තිබු ගම් දෙක තුනක් මෙන් විශාල ය. මේ කාලයෙහි ධ්‍යාන ලාභීව සිටි දේවදත්ත හිමියන්ට මෙබඳු අදහසක් පහළ විය. තථාගතයන් වහන්සේගේ භික්ෂුපිරිස මා විසින් පාලනය කළ යුතු යි. මේ අදහස පහළ වනවාත් සමගම දේවදත්ත හිමියන් ධ්‍යානයෙන් පිරිහිනි. මේ බව දුටු ඉහත කී කකුධ නම් මනෝකායික දිව්‍ය පුත්‍රයා ඒ බව මහ මුගලන් හිමියන්ට දැන්වී ය. මුගලන් හිමියන් මේ බව තථාගතයන් වහන්සේට දැන්වී ය. ඒ අවස්ථාවේදී බුදුපියාණන් වහන්සේ මුගලන් හිමියන්ගෙන් අසන්නේ ඔය අදහස් දේව පුත්‍රයා කී නිසා පිළිගත්තේ ද, නැත්නම් ඇත්ත වශයෙන්ම සිදු වූ දෙයක් ද කියා යි. එහිදී මුගලන් හිමියන් පවසන්නේ ස්වාමීනි මෙය සත්‍යයක්ම බව යි. එහිදී යථාවාදී තථාකාරී ගුණයෙන් යුක්ත බුදුපියාණන් වහන්සේ මුගලන් හිමියන්ට දේශනා කලේ මුගලන් හිමියනි කට පරිස්සම් කරගන්න, "රකඛසෙසතං මොගගලලාන වාචං" යනුවෙනි. ඔබ කියන දේවත්ත නම් හිස් මිනිසා තමාගේ හිස් බව්න්ම ප්‍රසිද්ධ වෙන්න ඉඩ හරින්න. ඔබ නිහඬව සිටින්න. මෙයින් කියවෙන්නේ යථාවාදී තථාකාරී ගුණය නොහඳුනන දේවදත්ත හිමියන් ප්‍රකාශ කරාවි. මම එහෙම දෙයක් හිතුවෙවත් නැත. මේ මුගලන් හිමියන්ගේ අභූත චෝදනාවක් කියා. බුදු පියාණන් වහන්සේ උත්තරීතර නායක යෙකු ලෙස මේ අවස්ථාවේදී ක්‍රියා කර ඇති බව පැහැදිලි යි. බොරුව රජකරන ලෝකය තුළ බොරුකාරයාට නොකළ හැකි පාපකර්මයක් නැත. සත්‍යවාදීන් ලෙස ලොව තුළ ජීවත් වන බොහෝ දෙනා බොරුකාරයෝ ය. දේවදත්ත හිමියන් ද සමාජය ඉදිරියේ සත්‍යාවාදීයෙකු ලෙස පෙනී සිටි බොරුකාරයෙකි. ඒ නිසා වචන පාවිච්චි කිරීමේදී ඉතා පරිස්සම් විය යුතු බව මෙහිදී පෙන්වා දෙයි.

මෙම කකුධ සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ කියන දේ කරන කරන දේ කියන ශාස්තෘවරයෙකු හැටියට පෙන්වා දෙමින් එදා ජීවත් වූ ශාස්තෘ කණ්ඩායම් පහක් ගැන විස්තර කර යි. එම ශාස්තෘන් වහන්සේලා තමන් ලග නැති ගුණ ධර්ම පහක් සමාජයට පෙන්වමින් දායකයින්ගේ සිව්පසය පරිභෝග කරමින් ජීවත්වන බව දක්වයි. ඒ කණ්ඩායම් පහ ගැන වෙන වෙනම හඳුනා ගැනීම මෙහිදී ප්‍රයෝජනවත් වේ.

01. (අපරිසුදධ සීලො සමානො පරිසුදධ සීලොමහීති පටිජානාති)

සමහර ශාස්තෘවරු අපිරිසුදු සිල් ඇතිව තමා තුළ පිරිසුදු සිල් ඇතැයි පෙන්වමින් ජීවත් වෙති. එම ශාස්තෘවරුන් ගේ ශ්‍රාවකයින් ද මේ බව දනිතත් ඒවා දායකයින්ට නොකියන්නේ එසේ කීම තම ගුරුවරයාගේ අකමැත්ත බව දන්නා නිසාත්, එසේ කීවොත් ගුරුවරයාට ලැබෙන චීවර පිණ්ඩපාත සේනාසන ගිලන් පස ආදිය නොලැබෙන නිසාත් ය. ඒ නිසා තම ගුරවරයාගේ ක්‍රියා කලාපයෙන්ම ඔවුන් ප්‍රසිද්ධ වේවා යි. සිතා ඒ ශ්‍රාවකවරු ශාස්තෘවරයාගේ සීලය පිළිබඳ අඩුපාඩුකම් සඟවාගෙන සිටී. මේ යථාවාදී තථාකාරීත්වයෙන් තොර පළමු කණ්ඩායමයි.

02. (අපරිසුධාජීවො සමානො පරිසුදධා ජීවොමහීති පටිජානාති)

සමහර ශාස්තෘවරු අපිරිසුදු දිවිපැවැත්මක් ඇත්තේ තමා තුළ පිරිසිදු දිවි පැවැත්මක් ඇතැයි පෙන්වමින් ජීවත් වෙති. එම ශ්‍රාවකයින් තම ශාස්තෘන්ගේ අපිරිසිදු දිවිපැවැත්ම දැක දැකත් ඒවා සඟවාගෙන තම ගුරුවරු ආරක්ෂා කරන්නේ ලැබෙන ප්‍රත්‍ය පහසුකම් නැතිවන බැවිනි.

03. (අපරිසුදධ ධමම දෙසනො සමානො පරිසුදධ ධමම දෙස නොමහීති පටිජානාති)

සමහර ශාස්තෘවරු අපිරිසිදු ධර්ම දේශනා ඇත්තේ තමාතුළ පවත්නා ධර්ම දේශනා පිරිසිදුයයි පවසමින් ජීවත් වෙති. එම ශ්‍රාවකයින් තම ගුරුවරයාගේ දේශනා අපිරිසිදු බව දැන දැනත් ඒවා සඟවාගෙන තම ගුරුවරුන් ආරක්ෂා කරගෙන සිටී.

04. (අපරිසුදධ වෙයයාකරණො සමානො පරිසුදධ වෙයයාකරණොමහීති පටිජානාති)

සමහර ශාස්තෘවරු අපිරිසිදු ව්‍යාකරණ (ධර්ම විවරණ) ඇත්තේ පිරිසුදු ව්‍යාකරණ ඇතැයි කියමින් ජීවත්වෙති. එම ශ්‍රාවකයින් තම ශාස්තෘවරයාගේ දහම් විවරණ අපිරිසිදු බව දනිතත් ඒවා ප්‍රසිද්ධ නොකොට ගුරුවරයා ආරක්ෂාකර ගනී

05. (අපරිසුදධ ඤාණ දසසනො සමානො පරිසුදධඤාණ දසසනොමහීති පටිජානාති)

සමහර ශාස්තෲවරු අපිරිසිදු ඤාණ දර්ශන ඇත්තේ පිරිසිදු ඤාණ දර්ශන ඇතැයි කියමින් ජීවත් වෙති. එම ශ්‍රාවකයින් තම ශාස්තෲවරයාගේ අපිරිසිදු ඤාණදර්ශනය ගැන දනිතත් ඒවා සඟවාගෙන ගුරුවරයා ආරක්ෂා කර ගනී.

එදා භාරතයේ ජීවත් වූ යථාවාදී තථාකාරී ගුණයෙන් ඈත් වූ සමහර ශාස්තෲවරු අපිරිසිදු සිල්, අපිරිසිදු ජීවිකාව, අපිරිසිදු ධර්ම දේශනා, අපිරිසිදු ධර්ම විවරණ, අපිරිසුදු ඤාණදර්ශන, ඇතිව ජීවත් වෙමින් තමා තුළ පිරිසිදු සිල්, පිරිසිදු ජීවිකාව, පිරිසිදු ධර්ම දේශනා, පිරිසිදු ධර්ම විවරණ, පිරිසිදු ඤාණ දර්ශන ඇතැයි පෙන්වමින් බොරු ප්‍රදර්ශන කරමින් ජීවත් වෙති. එම ශ්‍රාවකයින් ද තම ගුරුවරුන්ගේ සත්‍ය ස්වරූපය හෙළි නොකොට ඔවුන් ආරක්ෂා කර ගනී. ඒ නිසා එම ශාස්තෲන් වහන්සේලාගේ පැවැත්ම ශ්‍රාවකයින් මත රඳා පවතී. මෙම සූත්‍රයේ ඉතා වැදගත් සඳහනක් වෙයි. යමෙකු යමක් කරන්නේ නම්, එ තුළින් ඔහු ප්‍රසිද්ධ වේ යනු යි. (යං තු මො කරිසසති, තුමොව තෙන පඤ‌ඤායිසසති)

තථාගතයන් වහන්සේ මෙහිදී දේශනා කරන්නේ ඉහත කී කරුණු පහ සම්බන්ධයෙන් තමන් වහන්සේ යථාවාදී තථාකාරී ගුණයෙන් යුක්ත බව යි. මුගලන් හිමියනි මගේ සීලය පිරිසිදුය. මම ශ්‍රාවකයින්ගේ ආරක්ෂාව නොපතමි. මම පිරිසිදු ආජීව ඇතිව ජීවත් වෙමි. මගේ ධර්ම දේශනා පිරිසිදුය .මගේ ධර්ම විවරණ ඉතා පිරිසිදු ය. මගේ ඥාණ දර්ශනය පිරිසිදු ය. ඒ නිසා පෙරකී බොරු ප්‍රදර්ශන කරන ශාස්තෲවරු මෙන් මම මගේ ශ්‍රාවකයින්ගෙන් ආරක්ෂාවක් නොපතමි. මේ කරුනු වලින් පැහැදිලි වන්නේ තථාගතයන් වහන්සේ තුළ පැවැති පූර්ණ පෞරුෂය යි. සිංහයෙකු ලෙස සමාජය තුළ ජීවත් විය හැක්කේ එවැනි නිවැරදි චරිතයක් ඇති අයෙකුට පමණි.

බුදුන්වහන්සේ මෙම නිවැරදි ජීවිතය බෝධිසත්ව අවධියෙහි පවා ක්‍රියාත්මක වූ සැටි ජාතක පොතේ එන භාරිත ජාතකය පෙන්වා දෙයි. බරණැස් නුවර බ්‍රහ්මදත්ත රජු රාජ්‍ය කරන සමයෙහි අප මහ බෝසතාණෝ අසූ කෝටියක් ධනය ඇති කුලයක රන්වන් ශරීරයක් ඇතිව භාරිත නමින් උපත ලබා දෙමාපියන්ගේ ඇවෑමෙන් එම වස්තුවට හිමිකම් කියමින් ගිහි ජීවිතය ගත කොට පැවිදි වී පඤ්චාභිඥා අෂටසමාපතති උපදවා ගෙන කැලයේ ජීවත් විය. ලුණු ඇඹුල් සෙවීම සඳහා නගරයට පැමිණි අවස්ථාවක භාරිත තාපස තුමා රජතුමාට මුණ ගැසිනි. තාපසතුමාගේ සිල්වත් ගුණවත් ජීවිතය ගැන පැහැදුනු බඹදත් රජතුමා තම රජගෙදරම කුටියක් කරවා වසර 12 ක් සියතින්ම තාපසතුමාට උපස්ථාන කළ හ.

මේ කාලය තුළ රජතුමාගේ විජිතයෙහි කැරැල්ලක් මැඩලීම සඳහා රජතුමාට රජගෙදරින් ටික දිනකට ඈත් වී සිටීමට සිදුවිය. යා යුතුම ගමනක් නිසා රජතුමා රජගෙදරින් පිටවී ගියේ තාපසතුමාගේ සියලු උපස්ථාන තම දේවියට පවරමිණි. මෙසේ කල්ගත වෙද්දී තාපස තුමා දේවිය නිසා කෙලෙස් වසඟත්වයට පත්විය. මේ බව රජතුමාට ආරංචි වූ නමුත් රජතුමා පිළි නොගත් හ. පසුව රජ ගෙදරට අවුත් බිසව ගෙන් අසා දැනගත් නමුත් රජතුමා පිළිනොගත් හ. රජතුමා භාරිත තාපසතුමා හමුවී මේ ගැන ඇසූ හ. එවිට තාපස තුමා කියා සිටියේ රජතුමනි මේ දිග සසරෙහි මවිසින් පරපණ නසා ඇත. සොරකම් කර ඇත. කාමයන්හි වරදවා හැසිර ඇත. සුරාපනය කොට ඇත. නමුත් කිසිදාක බොරුවක් කියා නැත. ඒ නිසා මෙතනදී මට බොරුවක් කිව නොහැක. මම කෙලෙස් වසඟභාවයට පත් උනෙමි යයි ප්‍රකාශ කළ හ. මෙම ජාතක කථාවෙන්ද හෙළිකරන්නේ තථාගතයන් වහන්සේ බෝධි සත්ව අවදියෙහි පවා යථාවාදී තථාකාරී ගුණයෙන් යුක්තව ජීවත් වූ බව යි.

අද මෙම වෙසක් පුර පසළොස්වක පොහොය දිනයෙහි අපේ සදහම් පණිවිඩයෙන් සිහිපත් කරන්නේ බුදුපියාණන් වහන්සේ තුළ පැවැති එම සත්‍යවාදී ජීවිතය, ගිහි පැවිදි අප කාගේත් ජීවිතවලට ලංකරගත යුතු බව පෙන්වා දීමයි. නූතන සමාජයෙහි ගිහි පැවිදි බොහෝ දෙනා තථාගත සත්‍ය ධර්මය ඉගෙන ගෙන ඒවා බොහෝකොට ප්‍රකාශ කරති. නමුත් ඒ ප්‍රකාශ කරන දේ බොහෝ දෙනෙකුගේ ජීවිතවල ක්‍රියාත්මක නොවේ. එවැනි ගිහි පැවිදි අය බුදුන්වහන්සේ හඳුන්වා ඇත්තේ අනුන්ගේ ගෙරි හරක් බලනා ගොපල්ලෙකුට ය. ගවයාගෙන් ලැබෙන පස්ගෝරස ගොපල්ලාට නෙලැබේ. ඒවා ලැබෙන්නේ ගව හිමියාට යි. ඒ නිසා දේශනා කරන ධර්මය තමා ළඟ පවත්වා ගැනීමට ගිහි පැවිදි සියලුම දෙනා උත්සුක විය යුතු යි. ධම්ම පදයේ අත්ත වර්ගයේදී දේශනා කොට ඇත්තේ තමා කියනා දේ මුලින් තමා පිළිපැදිය යුතු යි.

ඒ තත්වයෙහි පිහිටා අනුන්ට අවවාද කළ යුතුයි. එසේ කරන්නා සමාජය තුළ දෝෂදර්ශනයට පත් නොවේ. ''

අතතාන මෙව පඨමං පතිරූපෙ නිවෙසයෙ
අථඤඤ මනුසාසෙය්‍ය න කිලිසෙය්‍ය පණ්ඩිතො (අතතවගගය)

ඉහත කී අදහසට ලෝකෝපකාරය නම් කවි පොතේ දී රණස්ගල්ලේ හිමියන් පවසන්නේ මෙසේ ය.

ඔවා දෙනු පරහට තමා සම්මතෙහි පිහිටා සිට
දුසිරිත දනන් දෙන ඔවා වැද්දන් කියන බණ වැනි

අද සමාජය බොහෝ විට වැටී තිබෙන්නේ ඉහත කී වැදි බණ ක්‍රමයට යි. කුඩා දරුවාගේ පටන් මහල්ලා දක්වාම ගිහි පැවිදි සමාජයේ බොහෝ දෙනා ප්‍රකාශ කරන දේ ඔවුන්ගේ ජීවිත වල නැත. උදාහරණයක් හැටියට ගතහොත් බුදු පියාණන් වහන්සේ කුල භේදය නුසුදුසුය යි දේශනා කළ සේක. ඒ ප්‍රකාශ කළ දේ ක්‍රියාවට නංවමින් තම සාසනයෙහි හැම කුලයකම අය පැවිදි කරවූ සේක. නමුත් නූතනයෙහි බොහෝ පැවිද්දන් කුල ක්‍රමයෙහි නිසරු බව දේශනා කරන නමුත් ඒ තත්වය තමන්ගේ ජීවිත වල ප්‍රායෝගික වශයෙන් ප්‍රදර්ශනය නොකරති. ඒ නිසා උන්වහන්සේලාගේ බොරු ප්‍රදර්ශන දේශනා අද වැදි බණ වැනි තත්වයට පත්වී තිබේ. බුදුන්වහන්සේගේ ශ්‍රේෂ්ඨ ජීවිතය සිහිපත් කරන අද දිනයෙහි තථාගතයන්වහන්සේට ප්‍රතිපත්තියෙන් පූජා කරනවාය කියා කියන්නේ කුල භේදයෙන් තොරව ජීවත් වීම යි.

බෝහෝ ගිහි ගෙවල්වල තත්වයද මෙසේම ය. ඔවුන්ගේ දේශනා වලදී කුලයේ නිසරු බව ගැන මහා ශබ්ද පවත්වති. නමුත් තම දරුවෙක් වෙනත් කුලයක දරුවෙකු සමග සබඳතාවයක් ගොඩනගාගතහොත් බොහෝ දෙමාපියවරු කියන්නේ "දරුවනේ ! ගඟේ මුහුදේ කපා දැමුවත් ඔය වැඬේ නම් අපෙන් නොකෙරෙන බවයි. '' එයින් ද පැහැදිලි වන්නේ ගිහි පැවිදි බොහෝ දෙනා කියනදේ නොකරන පිරිසක් බවට පත්වී ඇති බවයි. ඒ නිසා ඔවුන්ගේ බණ අද වැදි බණ තත්වයට පත් වී තිබේ.

බුදුපියාණන් වහන්සේ කකුධ සූත්‍රයේදී දේශනා කළේ තමා තුළ පවත්නා පිරිසුදු සීලය, ආජීවය, ධර්ම දේශනා, ධර්ම විවරණ, ඥාණදර්ශනය තුළින් මම ප්‍රසිද්ධ වී සිටිමි. මට කාගෙවත් ආරක්ෂාවක් අවශ්‍ය නැත. ඕනෑම කෙනෙකුට මා ගැන සෙවීමට ඉඩ ඇත. අපිත් එසේ කීමට සමත් පිරිසක් විය යුතු යි . බුදුපියාණන් වහන්සේට ප්‍රතිපත්තියෙන් පූජා කරනවාය කියන්නේ එවැනි අවංක වැඩ පිළිවෙල කටයි. නමුත් නූතන සමාජය තුළ බොහෝ විට දක්නට ලැබෙන්නේ බොරු ප්‍රදර්ශනයෝ ය.

නැති රහත් ගුණ සමාජයට පෙන්වමින් සමාජය රවටන ගිහි පැවිදි බොහෝ දෙනා ආමිෂයට බර වී සමාජය සූරාකන තත්වයට පත්වී තිබේ. අද පවත්නා බොහෝ පුද පූජාවන් බුදුන් වහන්සේගේ ප්‍රතිපත්තිමය දේශනාවට පටහැනි ඒවා බව තේරුම් ගත යුතු යි. එම බොහෝ පුද පූජාවන් ආර්ථික වශයෙන් සමාජය සූරාකන දේ බව තේරුම් ගෙන එවැනි ගිහි පැවිදි බොරුකාරයින්ගෙන් ප්‍රවේශම් විය යුතු ය.

තථාගතයන් වහන්සේ දේශනා කළ දාන, ශීල, භාවනා යන තෙවදෑරුම් පිංකම්වල අවංකව ක්‍රියා කොට කියන දේ කරන, කරන දේ කියන පිරිසක් බවට පත්වී දෙලොව ජය ගැනීමට මෙම වෙසක් පොහොය දින අධිෂ්ඨාන කර ගනිමු.